**ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 153.21 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 105.20 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 48.01 ක් හෙවත් සියයට 31.34 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 58.88 | 56.87 | 2.01 | 3.41 |
| මූලධන | 94.33 | 48.33 | 46.00 | 48.76 |
| එකතුව | 153.21 | 105.20 | 48.01 | 31.34 |

**2.2** **අත්තිකාරම් ගිණුම**

**2.2.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 21301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 10.00 | 9.04 | 5.00 | 6.19 | 35.00 | 21.99 |

**2.2.2** **වාණිජ අත්තිකාරම් ගිණුම**

**(අ)** **පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන්**

දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 5,615.00 | 2,188.87 | 4,000.00 | 5,580.99 | 4,000.00 | 679.26 | 1,900.0 | 1,534.3 |

**(ආ)** **මූල්‍ය ප්‍රතිඵල**

වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|
| | 2016 | | 2015 | |
| | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පොත් මුද්‍රණය ප්‍රචාරණය අලෙවිය | 1,095.38 | 343.53 | 2,034.2 | 1,171.4 |

**2.3** **අග්‍රිම ගිණුම**

**--------------**

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 7002/0000/00/0172/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 24.02 ක් විය.

**2.4** **පොදු තැන්පත් ගිණුම**

**----------------------**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 3 කට අදාලව 2016 දෙසැම්බර් 31 දින වන විට ශේෂ එකතුව රු.මිලියන 3.87 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/000/0001/0088/000 | 3.10 |
| 6000/0000/000/0013/0078/000 | 0.40 |
| 6000/0000/000/0016/0066/000 | 0.37 |
| | ----- |
| **එකතුව** | 3.87 |
| | ==== |

**2.5** **විගණන නිරීක්ෂණය**

**---------------------**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**---------------------------------------------**

**3.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-----------------------------------------------------------------**

විෂය අංක 21301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට වූ විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිග හිට තිබුණු ශේෂවල එකතුව රු.201,832 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ වර්ෂ 05 කට අධික කාලයක සිට අයකරගැනීමට අපොහොසත් වී තිබුණි.

**3.2** **වාණිජ අත්තිකාරම් ගිණුම**

**---------------------------**

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් විෂය අංක 21302 දරන පොත් මුද්‍රණය, ප්‍රචාරණය, අලෙවිය පිළිබඳ වාණිජ අත්තිකාරම් කාර්යයක කටයුතු ඉටු කර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ එම ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂය සඳහා වූ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් විගණන මතයක් ප්‍රකාශකළ නොහැකි වූ අතර, ඉකුත් වර්ෂවල ගිණුම් සම්බන්ධයෙන්ද විගණන මතයක් ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.603,560 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී මුද්‍රණාල හිමියන් වෙත ලබාදෙන ලද රු. මිලියන 668.87 ක මුද්‍රණ අත්තිකාරම් මුළු මුදලම නිෂ්පාදන ගිණුමේ මුද්‍රණ ගාස්තු ලෙස දක්වා තිබුණි. එබැවින් අත්තිකාරම් මුළුමනින්ම වැයකර තිබුණේද යන්න හා නොපියවූ අත්තිකාරම් කොපමණද යන්න නිශ්චය කළ නොහැකි විය.

(ඇ) 2016 වර්ෂයේදී සෙමෙන් විකුණන පොත් 102 ක ලැයිස්තුවක් වටිනාකමක් සඳහන් නොකර ගිණුම් සමඟ ඉදිරිපත් කර තිබුණු අතර කිසිදු පදනමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සෙමෙන් විකුණන පොත් වෙනුවෙන් රු.3,000,000 ක ප්‍රතිපාදනයක් සිදුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානය වනවිට එම ගිණුමේ රු.42,046,773 ක ශේෂයක් පැවතුණි.

(ඉ) ණය හිමි ගිණුමේ රු.364,466,325 ක ශේෂයක් වැඩියෙන් දක්වා තිබුණ අතර එම ශේෂය ලාභාලාභ විසර්ජන ගිණුමේ ණය හිමියන් ගැලපුම්කිරීම වශයෙන් සටහන් කර අඩුකර දක්වා තිබුණි.

(ඊ) 2016 ජනවාරි 01 දිනට භාවිතයට ගත නොහැකි රු.114,448,637 ක් වටිනා පොත් තොග ශේෂයක් පැවති අතර සමාලෝචිත වර්ෂය තුළ රු.87,667,015 ක් වටිනා පොත් තොගයක් පෞද්ගලික සමාගමක් වෙත රු.6,738,174 කට අලෙවි කර තිබුණි. එයින් සිදුවූ රු.63,808,154 ක ශුද්ධ පාඩුව වර්ෂයේ ලාභයට ගලපා නොතිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට භාවිතයට ගත නොහැකි පොත් තොගය රු.43,902,309 ක් විය.

(උ) දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය සඳහා ලබාදෙන පොත් වෙනුවෙන් පිරිවිතරයෙහි සඳහන් පිටු ප්‍රමාණයට වඩා අඩුවැඩි වූ විට මුද්‍රණාල හිමියාගෙන් අයකරගැනීමක් හෝ මුද්‍රණාල හිමියන්ට ගෙවීමක් සිදුකරනු ලැබේ. 2016 වර්ෂයේදී එසේ පිටු අඩු වැඩි වීමෙහි ශුද්ධ වෙනස වූ රු.19,206,008 ක ශේෂය ලාභාලාභ ගිණුමේ වෙනම අයිතමයක් වශයෙන් පෙන්නුම් නොකර මුද්‍රණ ගාස්තු වියදම් තුළ එකතු කර තිබුණි.

(ඌ) භාවිතයට ගත නොහැකි රු.303,469,564 ක පොත් තොගය, භාවිතයෙන් ඉවත්කළ පොත් තොග වශයෙන් ශේෂ පත්‍රයේ වර්ෂ 08 ක කාලයක් දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුන අතර මෙම භාවිතයට ගත නොහැකි පොත් තොග භෞතිකව පවතින බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(එ) වාර්ෂිකව භාවිතයෙන් ඉවත්කරන පොත් වෙනුවෙන් රු.43,902,309 ක ප්‍රතිපාදන සිදුකර 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.838,081,734 ක්වූ ශේෂයක් පැවතියද එම ප්‍රමාණයට අදාලව භාවිතයට ගත නොහැකි පොත් තොග ශේෂයක් ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඒ) 2010 දෙසැම්බර් 31 දින සිට වසර 06 කට අධික කාලයක් අපහරණ කිරීමට ඇති පිරිවැය වශයෙන් රු.312,831,071 ක ශේෂයක් ශේෂ පත්‍රයේ වගකීම් යටතේ දක්වා තිබූ අතර අපහරණ සිදුකිරීම හෝ එම පිරිවැය ඉවත් කිරීමක් සිදුකළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඔ) ලාභ අලාභ විසර්ජන ගිණුමේ වර්ෂයේ ශුද්ධ ලාභය පමණක් විසර්ජනය සඳහා යොදාගත යුතු වුවත් වර්ෂයේ ශුද්ධ ලාභයට අමතරව පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද රු.7,161,239,761 ක ශේෂයක්ද වර්ෂය තුල විසර්ජනය සඳහා යොදාගෙන තිබුණි.

(ඕ) 2015 වර්ෂයේ රු.4,464,177 ක ඔරුගොඩවත්ත ගබඩාව වෙනුවෙන් ගෙවන ලද ගොඩනැගිලි කුලී 2016 වර්ෂයේ කුලී ලෙස සටහන් කර තිබුණි.

(ක) 2016 ජනවාරි 01 දිනට තොග ශේෂය රු.1,401,355,548 ක් වුවද වෙළඳ ගිණුමේ රු.1,399,965,822 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,389,725 කින් දළ ලාභය වැඩියෙන් දක්වා තිබුණි.

**3.3 අනුකූල නොවීම්**

**-------------------**

**නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

**------------------------------------------------**

මුදල් රෙගුලාසි 510 (2) (ආ) විධිවිධාන ප්‍රකාරව අනුමත අත්තිකාරම් ගිණුමේ රු. මිලියන 1,596.92 ක ලාභය රාජ්‍ය ආදායමට පැවරීමට කටයුතු කර නොතිබුණි.

**3.4 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 29 දින පෙළපොත් රැගෙන ගිය ලොරි රථයක් කුරුණෑගල කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයේ පෙළපොත් ගබඩාවේ ගැටීමෙන් හානි සිදුවී තිබූ අතර වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු අනුව අළුත්වැඩියා වියදම රු.229,000 ක් විය. එසේ වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් අනතුර සම්බන්ධයෙන් වරදකරු නිශ්චය කර නොමැති අතර අළුත්වැඩියාවද සිදුකර නොතිබුණි.

(ආ) පාසල් පෙළපොත් බෙදාහැරීම

------------------------------------

පාසල් පෙළපොත් බෙදාහැරීම පිළිබඳ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2016 වර්ෂය සඳහා වූ පෙළපොත් 2016 ඔක්තෝබර් දක්වාම බෙදාහැර තිබුණි.

(ii) පෙළපොත් ඇනවුම් කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් හා අඩුවෙන් ලබාදුන් අවස්ථා තිබුණි.

(iii) පෙළපොත් බෙදාහැරීමේ මධ්‍යස්ථානවල අඩුපාඩු පැවතුණි.

(ඇ) පෙළපොත් මුද්‍රණයේදී මුද්‍රණ ඇණවුමේ සඳහන් පිරිවිතරවලට වඩා මුද්‍රණය කරන ලද පොත්වල පිටු වැඩි වීම වෙනුවෙන් රු.66,613,601 ක් හා පිටු අඩුවීම වෙනුවෙන් රු.57,359,362 ක් අඩුවෙන් ගෙවා තිබුණි.

නැවත මුද්‍රණයේදී පිටු වැඩිවීම වෙනුවෙන් රු.3,176,989 ක වැඩිපුර ගෙවීමක් හා පිටු අඩුවීම වෙනුවෙන් රු.2,166,555 ක් අඩුවෙන් ගෙවා තිබුණි. මෙසේ පිටු අඩුවැඩි වීම සඳහා හේතු වූ පෙළපොත්වල සිදුකරන ලද සංශෝධන පිළිබඳ විගණනයට අනාවරණය නොවුණි.

(ඈ) 2016 වර්ෂය වෙනුවෙන් පෙළපොත් පිටපත් 44,073,100 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.3,651,746,650 ක් වටිනා ඇනවුම් රාජ්‍ය හා පෞද්ගලික මුද්‍රණාල වෙත භාරදී තිබුණ අතර දඩ මුදල් අයකිරීම හා නිදහස් කිරීම වෙනුවෙන් කරන ලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) දඩ මුදල් අයකිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු චක්‍රලේඛයක් හෝ වෙනත් විධිවිධාන සලසා නොතිබුණි.

(ii) පිරිවිතරවලින් බැහැරව මුද්‍රණය කරනු ලබන පොත් ප්‍රතික්ෂේප කිරීම වෙනුවට භාරගැනීම සිදුකර දඩ අයකර ගුණත්වයෙන් අඩු පෙළපොත් භාරගැනීම සිදුකර තිබුණි.

(iii) පොත් මුද්‍රණය සඳහා අදාළ මෘදු පිටපත් ඒවායේ ඇනවුම් භාරදෙන අවස්ථාවේ ලබාදිය යුතුය. කෙසේ වුවද, ගිවිසුම් පරිදි පෙළ පොත් මුද්‍රණය කර භාරදිය යුතු දින වනවිටත් අදාළ මෘදු පිටපත් මුද්‍රණකරුවන් වෙත ලබාදී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(iv) පෙළපොත් මුද්‍රණයේදී සිදුවන ප්‍රමාදය මුද්‍රණාල ප්‍රමාදය හා දෙපාර්තමේන්තු ප්‍රමාදය ලෙස දඩමුදල් ගණනය කරනු ලබන අතර ප්‍රමාද දින ගණන් සනාථ කිරීමේ ක්‍රමවත් පදනමක් නොතිබුණි.

(ඉ) පාසල් පෙළපොත් කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල හා තෝරාගනු ලබන පාසල් බෙදාහැරීමේ මධ්‍යස්ථාන මගින් බෙදා හැර තිබූ අතර කඩුවෙල කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලයට අයත් බෙදාහැරීමේ මධ්‍යස්ථානවල භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඇණවුම් ලේඛන අනුව ඉල්ලා ඇති පෙළපොත් ප්‍රමාණයට වඩා වැඩියෙන් පෙළපොත් ලබාදී තිබුණි.

(ii) 2017 ප්‍රථම පාසල් වාරය අවසාන වනතෙක්ම පෙළපොත් බෙදාදී තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 39 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 120 | 83 | 37 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 73 | 63 | 10 | - |
| (v) | වෙනත් | - | 102 | | 102 |
| | එකතුව | 242 | 290 | 54 | 102 |